**දේශීය ණය සහ සංවර්ධන අරමුදල - 2022**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මා ගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| i. සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.86,751,731ක් වුවද එය රු.172,730,801ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.85,979,070කින් වැඩියෙන් දක්වා තිබුණි.<br>ii. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය රු.69,641,957ක් අඩුවෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය රු.28,571,556 ක් අඩුවෙන් හා මූල්‍ය ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය රු.113,769,524ක් වැඩියෙන් ද වශයෙන් වෙනස්කම් නිරීක්ෂණය විය. | පෙන්වාදීම නිවැරදි වේ. අදාළ දෝෂ 2023 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | ගිණුම්කරණ ප්‍රමිතවලින් නියම කර ඇති ආකාරයට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 22 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස්වීම අතීතානුයෝගීව ව්‍යවහාර කළ විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එය ඉදිරිපත් කළ යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට නිවැරදි කරන ලද අගයන් දැක්වෙන සන්සන්දනාත්මක වටිනාකම් ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන වලට අනුව පසුගිය වර්ෂයේදී දක්වා තිබූ රු.87,303,108ක බදු පෙර ලාභය රු.661,570,406ක අලාභයක් ලෙසත් රු.3,454,569,841ක ණය හා ලැබිය යුතු ශේෂය රු.2,731,739,987ක් ලෙසත් සන්සන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය නොකෙරුණි. | 2022 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන ප්‍රතිප්‍රකාශිත කිරීම (Restate) හා සියළු වෙනස්කම් ද සහිතව 2023 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ණය හානිකරණය ගැළපීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ට අනුව ආයතනයට අනන්‍ය වූ ආකෘතියක් ගොඩනගාගෙන නොතිබුණු අතර ලාභ අරමුණු කර ගත් මූල්‍ය ආයතනයක ආකෘතියක් භාවිතා කර තිබුණි. තවද, හානිකරණ අගය ගණනය කිරීම සඳහා භාවිතා කරන ලද ආකෘතියට දත්ත ඇතුළත් කිරීමේදී හානිකරණය සඳහා විශේෂයෙන් සිදු කළ යුතු ඒකල ණයගැති වයස් විශ්ලේෂණයක් සිදු කර නොතිබුණි. | ණය හානිකරණය සඳහා යොදාගත් මොඩලය දැනට මූල්‍ය ආයතන භාවිතා කරන මොඩලයක් වුවත් අප ආයතනයේ ඇති ණයගැති දත්ත ප්‍රමාණය කුඩා වීම හා ඇතැම් සාර්ව ආර්ථික නිර්ණායක ආයතනයට ඍජුව භාවිතා කිරීමට ඇති හැකියාවේ ගැටළු 2021 සිට 2022 දක්වා වන ණය හානිකරණ වියදම රු.340,829,524 කින් අඩුවීමට හේතු වී ඇත. එබැවින් SLFRS 09 හි 5.5.15 ඡේදය යටතේ වන සරල ක්‍රමවේදය යටතේ මෙම හානිකරණ වියදම නැවත ගණනය කිරීමට පළපුරුදු විගණකවරයෙකුගේ සහාය ලබා ගැනීමට 2023.05.26 දින පැවති කොමසාරිස් මණ්ඩල රැස්වීමේදී තීරණය විය. | ගිණුම්කරණ ප්‍රමිතවලින් නියම කර ඇති ආකාරයට හානිකරණය ගැළපිය යුතු අතර ඒ සඳහා කොමසාරිස් මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 34 ඡේදය ප්‍රකාරව භාවිතා නොකරන ලද ඉදිරියට ගෙනා බදු අලාභය සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගත යුතු වුවද ඒ වෙනුවට වර්ෂයේ ලාභය හඳුනාගෙන සියයට 24 වෙනුවට සියයට 10 අනුපාතය යොදාගෙන විලම්භිත බදු වත්කම් ගණනය කර තිබූ බැවින් ඉදිරියට ගෙනා බදු අලාභය මත විලම්භිත බදු වත්කම රු.13,896,406 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබගේ පෙන්වාදීම නිවැරදි වේ. වැරදීමකින් 2022.01.01 දිනට ශේෂය අදාළ ගණනය කිරීමේදී පිටපත්වී ඇති අතර, පෙන්වාදී ඇති දෝෂ 2023 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතවලින් නියම කර ඇති ආකාරයට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලෙන් (UNDP) ලැබුණු ප්‍රදානවලින් දරන ලද රු.1,235,838කට සමාන ප්‍රමාණයක් ආදායම ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 ට අනුව හඳුනා නොගෙන මුළු ලැබීම වන රු.12,500,000 ක් වෙනත් ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. | කෙටිකාලීන ව්‍යාපෘතියක් වන බැවින් එහි සියළුම ආදායම් වියදම් අදාළ මුදල් වර්ෂයේ ආදායම් වියදම් ලෙස මුදල් පදනම මත ගිණුම් ගත කර ඇත. | - එම - |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට විලම්භිත බදු වත්කම රු.23,124,285ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එම අගය රු.7,856,456ක් ලෙස දක්වා තිබීමෙන් විලම්භිත බදු වත්කම රු.15,267,829කින් අඩුවෙන්ද වර්ෂයේ විලම්භිත බදු ආදායම ලෙස රු.16,980,756 ක් හඳුනාගත යුතු වුවද විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ එම ආදායම ලෙස රු.1,712,928 ක් හඳුනාගෙන තිබීමෙන් විලම්භිත බදු ආදායම රු.15,267,828කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබගේ පෙන්වාදීම නිවැරදි වේ. වැරදීමකින් 2022.01.01 දිනට ශේෂය අදාළ ගණනය කිරීමේදී පිටපත්වී ඇති අතර, පෙන්වාදී ඇති දෝෂ 2023 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | විලම්භිත බදු ආදායම නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | ඉදිරි වර්ෂයට අදාළ රු.14,015,293ක ස්ථාවර තැන්පතු පොළිය සමාලෝචිත වර්ෂයට ඇතුළත් කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ වෙනත් මෙහෙයුම් ආදායම් හා ලැබිය යුතු ආයෝජන පොළිය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ සිට අදාළ වර්ෂයට ගැනෙන ආයෝජන ආදායම පමණක් උපචිත පදනම මත ගිණුම් ගත කෙරේ. | ගිණුම් තැබීම නිවැරදිව සිදු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ඉදිරියට ගෙනා රු.20,572,935ක් වූ ලැබිය යුතු ආදායම් බද්ද පිළිබඳව තහවුරුවක් ගෙන කපා හැරීම වෙනුවට නාගරික සංවර්ධන අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ව්‍යාපෘතියේ (UDLIHP) ණයවල ලැබිය යුතු හිඟහිටි පොළි ගිණුමට මාරු කර තිබුණි. | මෙම බදු ප්‍රමාණය ලැබිය යුතු රඳවාගැනීම් බදු ගිණුමට මාරු කරනු වෙනුවට වැරදීමකින් UDLIHP හිඟහිටි පොළී ගිණුමට මාරුකර ඇත. අදාළ නිවැරදි කිරීම 2023 වර්ෂයේදී සිදුකෙරේ. | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු ණය පොළිය රු.53,142,999ක්, ණය හා ලැබිය යුතු යටතේ දැක්විය යුතු වුවද, එය වෙනත් වත්කම් යටතේ දක්වා තිබුණි. | ණය කළමනාකරණ මෘදුකාංගයේ පෙන්වන ශේෂය 2022 ට අදාළව ලැබිය යුතු පොළී ආදායම පමණි. නමුත් ලෙජරයේ 2022 ට ලැබිය යුතු පොළී ආදායමට අමතරව 2021 ට ලැබිය යුතු පොළී ආදායමෙන් නොලැබී ඇති ශේෂද ඉදිරියට ගෙන යන බැවින් මෙම වෙනස ඇතිවේ. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ආදායම් බදු අධි වෙන් කිරීම රු.2,319,635ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදමට එරෙහිව ගැලපීමට කටයුතු නොකර සමුච්චිත අරමුදලට ගළපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වසරට අදාළව ආදායම් බදු ගැලපීම් 2021 වසරේ ගිණුම්වලට අදාළව සිදුකර ඇති බැවින්, එම ගෙවීම සත්‍ය වශයෙන් සිදුකරන විට 2022 වසරේ අදාල ඌන හෝ අතිරික්තයේ ගෙවීම ගැලපීම සිදු කළ යුතු වන්නේ 2021 වසරට අදාළව බැවින්, එය සමුච්චිත අරමුදලට ගළපා ඇත. | - එම - |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපි වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ණය ප්‍රාග්ධන වටිනාකම | 1,575,826,476 | 1,556,330,231 (ණය කළමනාකරණ මෘදුකාංගය අනුව) | 19,496,245 | ණය කළමනාකරණ මෘදුකාංගයේ වාර්තාවන්වල කලින් ලැබෙන ආදායම් අදාළ වර්ෂයේදීම අඩුකර පෙන්වන නමුත්, ලෙජරයේ ගිණුම්ගත කිරීමේදී එසේ කරනු නොලබයි. අවිනිශ්චිත පොලී ආදායම් ගිණුමේ ශේෂයන් සහ පරිගණක පද්ධතියේ ශේෂයන් අතර සැසඳීමක් සිදුකළ නොහැක්කේ මෙම හේතුව නිසාවෙනි. | ලෙජර ගිණුම් ශේෂයන්ට මෘදුකාංග යේ ශේෂයන් සැසඳිය යුතුය. |
| (ආ) | අවිනිශ්චිත පොලී වටිනාකම | 709,251,218 | 504,723,323 | 204,527,895 | | |
| (ඇ) | පොලී ආදායම, | 124,270,999 | 123,950,039 | 320,960 | 2021 වර්ෂයේදී 2022 ට අදාළව ලද පොලී ආදායමකි. එබැවින් අත්තිකාරම් ගිණුමේ තිබූ 2022 වර්ෂයට අදාළ පොලී මුදල් පොලී ආදායම් ගිණුම්වලට බැර කර ඇත. නමුත් ණය කළමනාකරණ මෘදුකාංගයේ එම අගය 2021 වර්ෂයේදී ලැබීමක් ලෙස, අදාළ ණය ගිණුමේ ආරම්භක ශේෂයට පියවා ඇත. | ලෙජර ගිණුම්වල ශේෂයන්ට උපලේඛන යේ ශේෂයන් සැසඳිය යුතුය. |
| (ඈ) | ණය හා ලැබිය යුතු | 1,575,826,476 | 1,570,584,539 (උපලේඛන අනුව) | 5,241,937 | | |
| (ඉ) | කලින් ලද ණය හා අත්තිකාරම් | 2,848,299 | 2,502,558 | 345,741 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඊ) | පළාත් පාලන ආයතන 04කට අදාළ ණය ශේෂ වටිනාකම | 968,589,356 (ණය කළමනාකරණ මෘදුකාංගය අනුව) | 635,069,504 (මෘදුකාංගය විසින් ජනනය කරනු ලබන ණය ශේෂ තහවුරු කිරීමේ ලිපිවලට අනුව) | 333,519,852 | 2022 වර්ෂයේදී නිකුත් කරන ලද ණය නිදහස් කිරීම 2022.12.31 දිනට ණය ශේෂ වාර්තාවේ ඇතුලත් වුවද පරිගණක පද්ධතියේ දෝෂයක් හේතුවෙන් ණය ශේෂ තහවුරුවේ එම මුදල එකතු වී නැත. එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | පරිගණක පද්ධතියේ පවතින දෝෂය නිවැරදි කරගත යුතුය. |
| (උ) | ලැබිය යුතු ණය | 2,675,720,913 (ණය කළමනාකරණ මෘදුකාංගය අනුව) | 2,653,594,768 (තහවුරු කිරීම් අනුව) | 22,126,145 | | |

### 1.5.4 අනුචිත ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හානිකරණ අගය ගණනය කිරීම සඳහා ලෙජර ගිණුම්වල ශේෂ යොදාගෙන තිබුණ ද ලෙජර ගිණුම් හා උපලේඛන අතර වෙනස්කම් පැවතීම, අවිනිශ්චිත පොලී වටිනාකමට අදාළ උපලේඛන ඉදිරිපත් නොවීම සහ මෘදුකාංගයේ ශේෂ හා ලෙජර ගිණුම් අතර වෙනස්කම් පැවතීම යන කරුණු හේතුවෙන් එම ශේෂවල නිරවද්‍යතාවය තහවුරු නොවන බැවින් රු.1,333,047,846ක් වූ හානිකරණය සඳහා වෙන් කිරීම සහ රු.340,829,524ක් වූ හානිකරණ ලාභයෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගත නොහැකි විය. | අදාළ වෙනස්කම් සිදු කර 2022 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන ප්‍රතිප්‍රකාශිත කර (Restate), සියළු වෙනස්කම් ද සහිතව 2023 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව. | ලෙජර ගිණුම්වල දැක්වෙන ශේෂයන්, උපලේඛන ශේෂයන් හා මෘදුකාංගයේ දැක්වෙන ශේෂයන් එකිනෙකට පරස්පර නොවිය යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවිනිශ්චිත පොලී ගිණුම් | 709,251,218 | උපලේඛන | ගිණුම් පිළියෙල කරනු ලබන අවස්ථාවේදී මෙම අවිනිශ්චිත පොළී ගිණුමට අදාළවන ලේඛනය නිශ්චිතව හදුනාගෙන නොතිබුණි. | ලෙජර ගිණුම්වල දැක්වෙන ශේෂයන්ට උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට රු.283,009,856ක් වූ අය නොවන ණය ශේෂය වර්ෂ 02 සිට වර්ෂ 38ක කාලයක් දක්වා හිඟ හිටව පැවතුණි. | 2022.12.31 දිනට අය නොවන ණය ශේෂ රු.මිලියන 283ක්ව පැවති අතර, එය 2023.09.30 දිනට රු.මිලියන 278 ක් දක්වා අඩුකර ගෙන ඇත. මෙම අය නොවන ණය ශේෂ අතුරින් වැඩිම අගයක් වන දඹුල්ල මහ නගර සභාවේ රු.මිලියන 106 ක ණය මුදල අයකිරීම සඳහා කටයුතු කරගෙන යනු ලබන අතර,අනෙකුත් පළාත් පාලන ආයතන සඳහා ණය ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරමින් පවති. | ණය අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.573,679,095ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.67,821,845ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.505,857,250ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, සමාලෝචිත වර්ෂයේ රු. 340,829,524ක හානිකරණ ලාභයක් ගැළපීම හා වෙනත් මෙහෙයුම් ආදායම් රු.102,165,916 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් රු.426,600,000ක් වූ ණය ව්‍යාපෘති 09ක් අනුමත කර තිබුණද ඒ අතරින් රු.51,800,000ක් වූ ණය ව්‍යාපෘති 02ක ගෙවීම් ආරම්භ කර වර්ෂය අවසාන වන විට රු.17,090,000ක් පමණක් නිකුත් කර තිබුණි. | ඉදිකිරීම් ප්‍රගතිය මත ණය මුදල නිදහස් කරනු ලබන බැවින් මෙවැනි තත්ත්වයක් පෙන්නුම් කළ හැකි ය. | ණය නිකුත් කිරීම කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන ලද ලාභය පදනම් කරගෙන රු.825,000ක ප්‍රසාද දීමනාවක් ගෙවා තිබුණද 1.5.1 (ආ) අනුව කළයුතු මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් සිදු කළේ නම් එය අලාභයක් වන බැවින් එසේ ප්‍රසාද දීමනා ගෙවීම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | ප්‍රසාද දීමනා ගෙවීමට 2023.02.24 දින කොමසාරිස් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. | නිවැරදිව ගළපන ලද ලාභය මත පමණක් ප්‍රසාද දිමනා ගෙවිය යුතු අතර අලාභය මත ප්‍රසාද දීමනා නොගෙවිය යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කළමනාකරණ පද්ධතිය, ණය කළමනාකරණ පද්ධතිය හා පොදු මොඩියුලය වශයෙන් අංශ 03ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කෙරෙන පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීමට රු.2,938,000ක් සහ 2020 වර්ෂයේ සිට වාර්ෂික නඩත්තු ගාස්තු වශයෙන් රු.587,600 බැගින් වර්ෂ 03ක් සඳහා රු.1,762,800ක් ගෙවා තිබුණි. එසේ වුවද ණය කළමනාකරණ පද්ධතිය හැරෙන්නට මූල්‍ය කළමනාකරණ පද්ධතිය හා පොදු මොඩියුලය භාවිතා කර නොතිබුණි. | මූල්‍ය කළමනාකරණ පද්ධතියට 2021 දක්වා දත්ත ඇතුලත් කර ඇතත් නිවැරදි වාර්තා ලබා ගත නොහැකි නිසා අක්‍රියව පවතී. | පරිගණක පද්ධතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |